# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

### අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය (II කොටස) - ප්‍රථම සෙමෙස්තරය - 2019

### BED 3103 - තුලනාත්මක අධ්‍යාපනය

**පැය තුනයි**

**පළමුවන කොටසේ සියලුම ප්‍රශ්නවලටද දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද (4) පිළිතුරු සපයන්න.**

---

## I – කොටස

1. තුලනාත්මක අධ්‍යාපනයේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය කෙටියෙන් පැහැදිලි කරන්න.

2. ගැමි පාසල (ගුරු ගෙදර) භාවිත කරන ලද ග්‍රන්ථ තුනක් (3) සහ ඉගැන්වීමේ ආධාරක දෙකක් (2) නම් කරන්න.

3. පෘතුග්‍රීසි පැරිෂ් පාසලෙහි හා ලන්දේසි පැරිෂ් පාසලෙහි වෙනස්කම් පහක් (5) දක්වන්න.

4. මෝගන් කමිටු වාර්තාවේ යෝජනා පහක් (5) ලියන්න.

5. මැලේසියානු අධ්‍යාපන පද්ධතියේ දැකිය හැකි ප්‍රධාන කරුණු පහක් ලියන්න.

6. 21 වන සියවසේ මුල්භාගය තුළ ස්වකීය අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා චීන අධ්‍යාපන බලධාරීන් විසින් යොදාගනු ලැබූ උපාය මාර්ග පහක් කෙටියෙන් විස්තර කරන්න.

7. 1981 වර්ෂයේ දී ඉදිරිපත් කළ ධවල පත්‍රිකාව මගින් හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පහක් ලියා දක්වන්න.

8. ස්ත්‍රී පුරුෂ සමාජතාවයට පසුබිම් වී ඇති සාධක පෙන්වා දෙන්න.

(ලකුණු 5x8= 40)

## II – කොටස

9. ගැමි පාසල, පන්සල් පාසල හා පිරිවෙන යන අංශ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනයෙහි සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 15)

10. (i) ප්‍රාථමික, ද්විතියික හා තෘතීයික යන අංශ ඔස්සේ සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනයේ ස්වභාවය පහදන්න.

(ලකුණු 7)

(ii) සංවර්ධිත රටවල අධ්‍යාපනයේ ප්‍රබලතා හා දුබලතා නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

11. i. "අධ්‍යාපනය මිනිස් සමාජයේ ජනවාර්ගික ගැටලු අවම කර ගැනීමට දායක කර ගත හැකිය." බහු සංස්කෘතික අධ්‍යාපන සංකල්පය ඔස්සේ මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 8)

ii. ශ්‍රී ලංකාවේ පවතින ජනවාර්ගික අසමගිය අවමකර ගැනීම සඳහා අධ්‍යාපනය යොදාගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 7)

12. i. තරුණ අසහනයට අධ්‍යාපන ගැටලු බසුබිම් වී ඇති ආකාරය නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 7)

ii. පූමිතිරිබව අනුව අධ්‍යාපන ක්‍රියාවලියේ දී සිදුවන විෂමතා හඳුන්වා ඒවායේ නව ප්‍රවනතා ශ්‍රී ලංකාව ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 8)

13. i. අධ්‍යාපනයේ ආර්ථික වටිනාකම තස්සේරු කරන ක්‍රම සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. අධ්‍යාපනය හා ආර්ථිකය අතර නොගැලපීමේ ගැටලුව විසඳීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග හා ආදර්ශ පෙන්වා දෙන්න.

(ලකුණු 8)

14. i. 1944 දී C.W.W. කන්නන්ගර මහතා විසින් ඉදිරිපත් කළ ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ විමසුමක යෙදෙන්න. (ලකුණු 8)

ii. සමාජීය හා ආර්ථික වශයෙන් ශ්‍රී ලාංකීය ජන සමාජය වෙනස් කිරීමට මෙකී ප්‍රතිසංස්කරණ බලපෑ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 7)

15. i. 1944 බට්ලර් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට පෙරාතුව තිබූ බ්‍රිතාන්‍ය ජනසමාජයේ ආර්ථික සාමාජික තත්වයන් විමසන්න.

(ලකුණු 8)

ii. ඉහත සඳහන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ඉදිරිපත් කළ ප්‍රධාන අධ්‍යාපනික වෙනස්කම් පෙන්වා දෙමින් එමගින් එම සමාජයට සිදුවන යහපත පිළිබඳව විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 7)

16. i. 1972 වසරේ සිදුකළ ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මොනාවාද?

(ලකුණු 8)

ii. ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතිය කෙරෙහි මෙකී ප්‍රතිසංස්කරණ බලපෑ ආකාරය පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 7)